රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 29/2014

මගේ අංකය : EST-7/LOANS/04/0207
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2014.12.29

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## <u>රජයේ නිලධාරීන්ට විශේෂ අත්තිකාරම්</u>

2006.11.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2006 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එකී චක්‍රලේඛයේ 03 ඡේදයේ 2006 වර්ෂය යන්න වෙනුවට 2014 වර්ෂය යන්න ආදේශ කිරීමට සහ 2007 වර්ෂය ලෙස සඳහන්ව ඇති සෑම ස්ථානයකටම 2015 වර්ෂය යන්න ආදේශ කිරීමට යටත්ව එකී චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව 2015 වර්ෂයට රු. 4000/-කට නොවැඩි වන විශේෂ අත්තිකාරම් මුදලක් ගෙවීමට රජය තීරණය කර ඇත. එසේම එම චක්‍රලේඛයේ 08 ඡේදයේ සඳහන් අයකර ගනු ලබන පොළිය බැර කළ යුතු ආදායම් ගිණුම් සංකේත අංක 20.02.20.02 (පොළිය හා වෙනත්) ද අංක 20.02.02.99 ලෙස සංශෝධනය කෙරේ.

03. මෙම අත්තිකාරම් ගෙවීම 2015.01.01 දිනෙන් ආරම්භ කර 2015.02.28 දිනෙන් අවසන් කළ යුතු වන අතර, 2015.02.28 දිනට පසු මෙම අත්තිකාරම් ගෙවීම නොකළ යුතුය.

04. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය